


# සයිප්‍රසයේ සිට ආ සොඳුරු නිමැවුම

පහු ගිය දොහක මුහුදු හතක් ගෙවාගෙන වළාකුළු පීරාගෙන පුංචි සුරංගනාවියක් වගෙ ආපු පුංචි පත්තරයක් අප අතට පත් උනා. කුළුඳුලේ කවිකතා ලියන පිරිසකගෙ නැවුම් අත්දැකීම් වලින් සුවඳවත් වෙලා තිබුණු ඒ පත්තරයෙ නම සොඳුරු . සයිප්‍රසයේ නිකෝසියා නගරයේ රැකියාවක නිරතව සිටින ශ්‍රී ලාංකික සහෝදරීයක වන නිරංජලා මනෝහාරි තමාගේ හිතවතුන් හිතවතියන් පිරිසක් හවුල් කරගෙන අපේ සිංහලකම රැක ගැනීමට කරන අවංක උත්සාහයක සුන්දර ප්‍රතිඵලයක්.

පත්තරේ නම වගෙම කවි, කතාත් හරිම සොඳුරුයි. පත්තරය පසුබිමේ දැවටී තියෙන උණු කඳුළු අතට දැනුනහම හිතට ආවෙ පුදුම ආවේගයක්.

සයිප්‍රසයේ සිටින සහෝදරීයන් සහෝදරයන් ගෙන් බොහොම දෙනෙක් අපේ පුංචි ලංකාවෙ ඈත පිටිසර ගම් වලින් සයිප්‍රසයේ රැකියාවලට ගිය අය. දවසේ පැය 18ක් 20ක් නොවිඳිනා දුක් විඳල, චුට්ටක් ඇහැ පියා ගන්න තියෙන පැය කීපයේදි ඔවුන් නිර්මාණකරණයේ යෙදෙන්නෙ තමන්ගෙ පුංචි කුටියෙ තියෙන තනිකම, හිත පුරා ඉහවහ යන දුක වේදනාව තුනී කර ගන්න නේද කියල හිතන කොට අපට දැනුනෙ ඒවගෙම දුකක් වේදනාවක්. නුතන තාක්ෂණයෙන් අංශු මාත්‍රයක් හෝ පහසුකමක් නැතිව දෑතින් ගොනුකර ගත් ලිපි ලංකාවට යවා මුද්‍රණය කරවා ගෙන්වා ගන්නා සොඳුරු පත්තරය, ඉරීදා නිවාඩු දිනයේදී අසල උයන් පෙතක ගස් සෙවණක සිට අපේම සොයුරු සොයුරීයන්ට අලෙවි කරමින් ඔවුන් මේ කියන්නේ අනේ අපිටත් ටිකක් සවන් දෙන්න කියා නේද? ඈත දුර මව් රටට බත් පත සපයන මේ දිරීය සොයුරන් සොයුරියන් තුල සිය මව්බස රැක ගැනීමට ඇති උත්සාහය ගැන ඇත්තටම අප තුල ඇති උනේ ලොකු ආඩම්බරයක්.

දිග ගමනක් යන්නට සොඳුරු පුවත්පතට අපෙනුත් සුබ පැතුම්

## ලංකා ජර්මානු කාර්මික අභ්‍යස ආයතනයේ ආදි ශිෂ්‍ය සංගමය විසින් සංවිධානය කරන ලද මෙල්බර්න් අවුරුදු සැනකෙළි අසිරිය











